සැ. යු. - 2010.04.30 වැනි දින පළ වූ අංක 1,652 දරන ගැසට් පත්‍රයේ I-III සහ II කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,653 - 2010 මැයි මස 07 වැනි සිකුරාදා - 2010.05.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1036 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1044 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1045 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 මැයි මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 අප්‍රේල් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# තනතුරු ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### කොට්ටාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

කොට්ටාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.(කොට්ටාවත්ත -මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුක්ත අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර “ලේකම්, කොට්ටාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය” යන ලිපිනයට 2010.05.21 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | රියදුරු II “ආ” | 02 | PL 3-2006A<br>රු.12,470-10x130-10x145<br>10x160-12x170-18,860 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසැලකින් 08 ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය. (09 වසර)<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර විසිහතරකට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා සිටිය යුතුය. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අදාළ සහතික ලබා තිබිය යුතුයි.)<br><br>වාහන රියදුරු වශයෙන් වසර 03ක පළපුරුද්ද(සහතික මගින් සනාථ කළ යුතුය.)<br><br>අවම උස අඩි 5 අඟල් 2 1/2 ක් තිබිය යුතුය.<br><br>දිවා රාත්‍රී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයේ සිටිය යුතු අතර, මනා දෑස් පෙනීමක් තිබිය යුතුය.<br><br>මාර්ග නීති පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය. |
| 02. | විදුලි කම්බිකරු III | 01 | PL 3-2006A<br>රු.12,470-10x130-10x145<br>10x160-12x170-18,860 | ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුය.<br><br>තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම.<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>වෘත්තියට අදාලව ජාතික වෘත්තීය සුදුසුකම්(NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම;<br><br>හෝ<br><br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET)වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; |

| | | | | |
|---|---|---|---|---|
| | | | | හෝ<br><br>ජාතික තරුණ සේවා සභාවේ (NYSC)වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br><br>හෝ<br><br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br><br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA)වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබාතිබීම;<br><br>හෝ<br><br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. |
| 03. | විදුලි කම්බිකරු සහායක III | 01 | PL I-2006A<br>රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600<br>(කාර්යක්ෂමතා කඩඉම රු. 12,090ට පෙර) | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත්වී තිබීම. |
| 04. | මාර්ග කම්කරු III | 01 | PL I-2006A<br>රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600<br>(කාර්යක්ෂමතා කඩඉම 2 වන පියවරේ සිට) | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක 05 ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය. |
| 05. | පුස්තකාල කම්කරු III | 01 | PL I-2006A<br>රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600<br>(කාර්යක්ෂමතා කඩඉම 2 වන පියවරේ සිට) | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී එක් වරකදී කවර හෝ විෂයයන් 06ක් සමත්ව තිබිය යුතුය. |

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය;
(2) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය;
(3) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බල නොපානු ඇත.) ;
(4) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතුය;
(5) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයන් හා ප්‍රායෝගික ලිඛිත පරීක්ෂණයන් මගින් සුදුස්සන් තෝරනු ලැබේ;
(6) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොට්ටාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*03. සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(1) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(2) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(3) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලටද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කොට්ටාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*04. අයදුම්කළ යුතු ආකාරය ෘ*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (A4 ප්‍රමාණයේ) අයදුම්පතක් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාල කවරයේ වම්පස ලියා 2010.05.21 දිනට පෙර "ලේකම්, කොටිකාවත්ත -මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. ) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියවිලිවල සහතික කල පිටපත් එවිය යුතුය.

(1) උප්පැන්න සහතිකය
(2) අධ්‍යාපන සහතිකය
(3) පදිංචිය සනාථ කිරීමේ සහතිකය
(4) මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය
(5) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්
(6) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතිකය
(7) සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය

වසන්ති වික්‍රමරත්න,
ලේකම් *(වැ.බ.),*
කොටිකාවත්ත -මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2010 අප්‍රේල් මස 10 වැනි දින,
ගොතටුව නව නගරය,
කොටිකාවත්ත -මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව***

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ................................ තනතුර සඳහා බඳවා ගැනීම*

(1) මුලකුරු සමග නම :——————————.
මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
(2) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
(3) ස්ථිර ලිපිනය:——————————.
(4) ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
(5) ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
(6) උපන් දිනය:
අවුරුද්ද :——————————.මාසය:——————————. දිනය:——————————.
(7) 2010.04.30 දිනට වයස:
අවුරුදු :——————————.මාස:——————————. දින:——————————.
ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද ලියාපදිංචිවීමෙන් ද?:——————————.
(8) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර):——————————.
(9) වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය.):——————————.
(10) සේවා පළපුරුද්ද:——————————.
(11) ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද ? :——————————.
(12) මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවාගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ෘ*

මෙම ඉල්ලුම්කරු වන ............................ මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:——————————.
පදවි නාමය:——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය:——————————.
(නිල මුද්‍රාව යොදන්න)
දිනය:——————————.

05-08

**මහව ප්‍රාදේශීය සභාව**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු

මහව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති වයඹ පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 03 ක ස්ථිර පදිංචිය ඇති ඒ ඒ තනතුරට ඉදිරියෙන් දක්වා ඇති සුදුසුකම් සහිත අයගෙන් 2010.06.01 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *තනතුරු නාමය* | *සේවක ගණය* | *තනතුරු ප්‍රමාණය* | *වැටුප් පරිමාණය* |
|---|---|---|---|---|
| I | ජල වැද්දුම්කරු | ප්‍රාථමික ශිල්පීය | 01 | රු.12,470-10x130-10x145<br>10x160-12x170-රු.18,860 |
| II | බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු | ප්‍රාථමික ශිල්පීය | 01 | රු.12,210-10x130-10x145<br>10x160-12x170-රු.18,600 |
| III | වැඩ පරිපාලක | ප්‍රාථමික අර්ධ ශිල්පීය | 01 | රු.12,210-10x130-10x145<br>10x160-12x170-රු.18,600 |
| IV | මාර්ග කම්කරු 02<br>සෞඛ්‍ය කම්කරු 01<br>මුරකරු 01<br>බැකෝ යන්ත්‍ර සහායක 01 | ප්‍රාථමික ශිල්පීය නොවන | 05 | රු.11,730-10x120-10x130<br>10x145-12x160-රු.17,600 |

(

*02. මූලික අධ්‍යාපන සුදුසුකම් :*

2.i. *මූලික අධ්‍යාපන සුදුසුකම් - ප්‍රාථමික ශිල්පීය ගණය*

*බාහිර අයදුම්කරුවන් :*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව, විෂයයන් 06ක් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර).

*අභ්‍යන්තර අයදුම්කරුවන් :*

දැනට මහව ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය( 9 වසර) සමත් විය යුතුය.

2.ii. *මූලික අධ්‍යාපන සුදුසුකම් - ප්‍රාථමික අර්ධ ශිල්පීය ගණය*

*බාහිර අයදුම්කරුවන් :*

අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර).

*අභ්‍යන්තර අයදුම්කරුවන් :*

දැනට මහව ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.

2.iii. *මූලික අධ්‍යාපන සුදුසුකම් - ප්‍රාථමික ශිල්පීය නොවන ගණය*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර).

03. *ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා පළපුරුද්ද :*

3.1 ශිල්පීය නිපුණතා :

3.1.2 ජල වැද්දුම්කරු හා බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා තනතුරේ කාර්ය භාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන NVQ 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

3.2 ප්‍රවීණතා පළපුරුද්ද :

3.2.1 ජල වැද්දුම්කරු තනතුර හා බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (මෙය සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය.).

3.2.2 වැඩ පරිපාලක තනතුර සඳහා අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක /රාජ්‍ය සංස්ථාවක/මණ්ඩලයක/ව්‍යවස්ථාපිත ආයතනයක හෝ රජය පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 02කට වැඩි කාලයක් සේවය කර තිබිය යුතුය. (සහතිකයකින් සනාථ කළ යුතුය.).

04. *වයස :*

සියළුම තනතුරු සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටම පළාත් හා රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.

05. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.
(iii) අයදුම්කරු /අයදුම්කාරි පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
(iv) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(v) දණ්ඩනීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
(vi) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක් මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් සනාථ කළ යුතුය.)
(vii) දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම්, වයස් සීමාව බල නොපැවැත්වෙන අතර, ඔහු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05ක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.
(viii) අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය මහව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

*06. අයදුම්පත් එවිය යුතු පිළිවෙල :*

සියලුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2010.06.01 දිනට පෙර ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, මහව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ කෙළවරේ .......................... තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනුපිටපත් ඇමිණිය යුතුය :

(1) උප්පැන්න සහතිකය,
(2) අධ්‍යාපන සහතික,
(3) හැඳුනුම්පතේ පිටපතක්,
(4) ග්‍රාම නිලධාරි සහතිකය,
(5) දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වූවන් නම් සේවා සහතිකය.

ඩබ්ලිව්. තන්තිරිගම,
ලේකම්,
මහව ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 07 වැනි දින,
මහව ප්‍රාදේශීය සභාවේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ මහව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශිල්පීය/අර්ධ ශිල්පීය/ශිල්පීය නොවන ගණයේ III වැනි පන්තියේ ................................ තනතුර සඳහා බඳවා ගැනීම**

(1) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————.
(ii) මුලකුරු සමග නම:——————————.

(2) ස්ථිර ලිපිනය:——————————.
(3) ග්‍රාම නිලධාරි වසම හා අංකය :——————————.
(4) උපන් දිනය:——————————.
අවුරුද්ද :——————————,මාසය:——————————. දිනය:——————————.
(5) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස:
අවුරුදු :——————————,මාස:——————————, දින:——————————.
(6) ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
(7) ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
(8) මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය වසර :——————————.
(9) ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ලියාපදිංචිවීමෙන් ද යන වග:——————————.
(10) අධ්‍යාපන සුදුසුකම් :——————————.
(11) වෙනත් සුදුසුකම් :——————————.
(12) වෘත්තීය සුදුසුකම් :——————————.
(13) සේවා පළපුරුද්ද :——————————.
(i) දැනට සේවය කරන ආයතනය :——————————.
(ii) දැනට දරන තනතුර :——————————.
(iii) එම තනතුරට පත්වූ දිනය :——————————.
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවාගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත්, කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන ............................................................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................ වශයෙන් සේවය කරයි. ඔහු /ඇය විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇයතෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට කුමන භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
හෝ බලයලත් නිලධාරියාගේ අත්සන.

නම:——————————.
පදවි නාමය:——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :——————————.
(නිල මුද්‍රාව තබන්න)
දිනය:——————————.

05-72

---

## කන්තලේ ප්‍රාදේශීය සභාව

### නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන කාර්යය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු

කන්තලේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන කාර්යය මණ්ඩලයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා දැනටමත් සේවයේ නියුතු ස්ථිර/ආදේශක/අනියම් සේවකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *මාසික ඒකාබද්ධ වැටුප* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| ඖෂධ සංයෝජක | රු.12,210-10x130-8x130 රු. 14,550 (PL 2-2006A) | අ.පො.ස. සා.පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ගණිතය/ශුද්ධ ගණිතය හා සිංහල භාෂාව සහිත විෂයයන් 6කින් සාමාර්ථය ලබා තිබිය යුතුය. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ. |
| ආයුර්වේද කම්කරු | රු.11,730-10x120-8x120-රු. 13,890 (PL 3-2006A) | යටත් පිරිසෙයින් 05 වැනි ශ්‍රේණිය සමත් වීම අදාළ ක්ෂේත්‍රයේ යටත් පිරිසෙයින් එක් වසරක පළපුරුද්ද |

| *තනතුරු නාමය* | *මාසික ඒකාබද්ධ වැටුප* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| රියදුරු | රු.12,470-10x130-8x130 -රු.14,810 (PL 3-2006A) | යටත් පිරිසෙයින් 05 වැනි ශ්‍රේණිය සමත් වීම අදාළ ක්ෂේත්‍රයේ යටත් පිරිසෙයින් එක් වසරක පළපුරුද්ද |
| සෞඛ්‍ය කම්කරු | රු.11,730-10x120-8x120-රු. 13,890 PL 3-2006A | යටත් පිරිසෙයින් 05 වැනි ශ්‍රේණිය සමත් වී තිබීම. |

*02. වයස :-* අවම වයස් සීමාව අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර උපරිම වයස් සීමාව අවුරුදු 40ට නොවැඩි විය යුතුය. (දැනටමත් සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

*03. වෙනත් සුදුසුකම් :-*

(1) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකිකයෙක් විය යුතුය.

(2) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(3) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහකරනු ලැබූ අයෙකු නොවිය යුතු අතර රා.ප.ච. අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

(4) දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

(5) අයදුම්කරු ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03කට නොඅඩු ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

*04. බඳවා ගැනීම් :*

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහත සඳහන් ලකුණු දීමේ පදනම මත බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

දැනට සේවයේ නියුතු සේවකයින් සඳහා පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන නියමිත ලකුණු ලබා දෙනු ලැබේ.

(1) නොකඩවා සේවයේ යෙදී ඇති එක් ලිත් වර්ෂයකට එක් ලකුණ බැගින් (උපරිම ලකුණු 40)

| | | |
|---|---|---|
| (2) | ස්ථිර පත්වීමක් නම් ලකුණු | 10 |
| | අනියම් පත්වීමක් නම් ලකුණු | 08 |
| | ආදේශක පත්වීමක් නම් ලකුණු | 05 |
| (3) | වයස අවුරුදු 18-40 අතර නම් ලකුණු | 02 |
| (4) | අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්ද | 15 |

*05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(2) මෙම තනතුරට පත්කරනු ලබන්නේ අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වය.

(3) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

(4) මෙම තනතුරට පත්කරනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වැනි පරිච්ඡේදයේ විධිවිධාන හා රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා කලින් කල පනවනු ලබන අනිකුත් නීති හා රෙගුලාසිවලට යටත් විය යුතුය.

(5) මෙම තනතුරට තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලට ද අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතුය.

(6 ) අදාළ සේවාවන් සඳහා සභාව මගින් නියම කරනු ලබන ඇපයක්, මුදලින් හෝ රක්ෂණ සහතිකයක් මගින් තැබිය යුතුය.

06. *අයදුම්පත් :-*

(1) අයදුම්කරුවන් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කර ගත් අයදුම්පත් 2010.05.14 දිනට පෙර “ලේකම්, ප්‍රාදේශීය සභාව, කන්තලේ ” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

(2) අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය,

*(ආ)* අධ්‍යාපන සහතික,

*(ඇ)* පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරීගේ සහතිකය,

*(ඇ)* මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරීගෙන් විය යුතුය,

*(ඉ)* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකය.

07. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම් හෝ වෙනත් වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලුම බලතල කන්තලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

බී. ඒ. අයි. ඩබ්. තිසේරා,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, කන්තලේ.

2010 ක් වූ අප්‍රේල් මස 19 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***ආදර්ශ අයදුම්පත්‍රය***

***කන්තලේ ප්‍රාදේශීය සභාව***

**.............................................. *තනතුර සඳහා වූ ආදර්ශ අයදුම්පත්‍රය***

(1) *(අ)* මුලකුරු සමග නම :——————————.

*(ආ)* සම්පූර්ණ නම:——————————.

(2) ලිපිනය :

*(අ)* පෞද්ගලික ලිපිනය :——————————.

*(ආ)* රාජකාරී ලිපිනය :——————————.

(3) (අ) උපන් දිනය:

අවුරුද්ද :——————————, මාසය:——————————, දිනය:——————————.

(ආ) 2010.................... වන දිනට වයස:——————————.

(4) උපන් ස්ථානය :——————————.

(5) දැනට පදිංචි ස්ථානය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:——————————.

(6) ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද ? එසේ නම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචියෙන් ද ?:——————————.

(7) ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.

(8) විවාහක /අවිවාහක තත්ත්වය:——————————.

(9) සමත්වී ඇති ඉහළම විභාගය:——————————.
(ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් විස්තර වෙනම අමුණන්න)

(10) අධ්‍යාපන හා වෙනත් වෘත්තීමය සුදුසුකම් :——————————.

(11) මීට පෙර රජය යටතේ හෝ සංස්ථාවල සේවයේ යෙදී සිටියේ නම් ඉන් අස්වීමට හේතු :——————————.

(12) දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර : :

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත් තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් වන්දි නොගෙවා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

05-145

# පළාත් පාලන නිවේදන

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තිය යටතේ ඉඩම් විකිණීම මත බදු අය කිරීම

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ පිහිටි ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ බ්‍රෝකර්වරයකු විසින් හෝ ඔවුන්ගේ සේවකයා විසින් නැතහොත් නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් එම විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට එකක (1%) බද්දක් 2010 වර්ෂයට පනවා අය කිරීමට තීරණය කර ඇති බවත්, මෙම බද්ද ගෙවීමට අදාළ ඉඩම් විකුනූ වර්ෂය අවසානයට පෙර අයවිය යුතු බවත්, මෙයින් දැනුම් දෙමි.

ටී. එම්. එච්. බී. තෙන්නකෝන්,
සභාපති,
ප්‍රාදේශීය සභාව, නිකවැරටිය.

05-114/8

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### 2010 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාර නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු වශයෙන් ප්‍රකාශයට පත්කොට ඇති ප්‍රදේශ තුළ පිහිටියා වූ සියලුම නිශ්චල දේපළවලින් වාර්ෂික වටිනාකමින් 5% (සියයට පහක) දේපළ බද්දක් පිළිවෙලින් අවසන් වන කාර්තු හතරකින් අයකර ගැනීමටත්, නියමිත දිනට නොගෙවන වාණිජ දේපළවලින් 15%ක් ද, වාණිජ නොවන දේපළවලින් 10% ක් ද, වනසේ අධිගාස්තුවක් අයකර ගැනීමටත්, තීරණය කළ බව මහජනයා වෙත දන්වනු ලැබේ.

2010 ජනවාරි මාසයේ 31 වැනි දිනට පෙර වර්ෂයට අදාළ බදු මුදල ගෙවුවහොත් 10% ක වට්ටමක් ද, කාර්තුවකට අදාළ බදු මුදල එම කාර්තුවේ ප්‍රථම මාසයේ දී ගෙවුවහොත් 5% ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

ටී. එම්. එච්. බී. තෙන්නකෝන්,
සභාපති,
ප්‍රාදේශීය සභාව, නිකවැරටිය.

05-114/6

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

### පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ එවකට පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබූ 1988.08.23 දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරන ලද්දා වූ ද දකුණු පළාත් සභාව විසින් 1990.07.25 දින සාකච්ඡා කරන ලදුව අනුමත කර 1991.02.01 දින අංක 648 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරන ලද්දාවූ ද අංක 01 සිට 42 දක්වා වූ පොදු අතුරු ව්‍යවස්ථා පිළිගැනීමටත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවන දින සිට කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත්, 2009.10.30 දින පවත්වන ලද කොටපොල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. පී. දයානන්ද,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව.

2009ක් වූ දෙසැම්බර් 10 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලය,
දෙනියාය.

05-183/2

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

### වරිපනම් බදු - 2010 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කොට ඇති සීමාව තුළ පිහිටියා වූ සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වරිපනම් බද්දක් පිළිවෙලින් 2010 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි හෝ ඊට පෙර ගෙවා අවසන් කළ යුතු පරිදි 2010 වර්ෂය සඳහා පනවා ඇති බව 2009 ඔක්තෝබර් මස 30 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ අංක 02:2 දරන සභා සම්මුතිය මගින් තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඒ. පී. දයානන්ද,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව.

2009 දෙසැම්බර් මස 10 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලය,
දෙනියාය.

05-183/7

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

### 2010 වර්ෂයට ඉඩම් විකිණීම මත බදු අයකිරීම

කොටපොල ප්‍රාදේශීය සභාව ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියක් හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් කොටපොල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි. 2010 ජනවාරි මස 01 වැනි දින සිට ඉදිරියට මෙම බද්ද ක්‍රියාත්මක විය යුතු බව 2009 ඔක්තෝබර් මස 30 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ අංක 02:2 දරන සභා සම්මුතිය මගින් දන්වා ඇත.

ඒ. පී. දයානන්ද,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව.

2009 දෙසැම්බර් මස 10 ක් වූ වැනි දින,
දෙනියායේ කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-183/9

# විවිධ දැන්වීම්

## කොටපොල ප්‍රාදේශීය සභාව

2010 වර්ෂය සඳහා බදු හා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147, 149,150 සහ 152 දරන වගන්තිවලින් සහ කොටපොල ප්‍රදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා වැළඳගෙන ඇති, 1988 අගෝස්තු මස 23 වැනි දින හා අංක 520/7 දරන IV (ආ) වන කොටස - පළාත් පාලන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා මගින් කොටපොල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් බදු හා ගාස්තු 2010 වර්ෂය සඳහා කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමා ඇතුළත පනවා අය කිරීමට 2009 ඔක්තෝබර් මස 30 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ අංක 2: 2 දරන සභා සම්මුතිය මගින් තීරණය කර ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී උපලේඛනයේ එක් එක් කොටසේ සඳහන් කර ඇති බදු හා ගාස්තු එහි සඳහන් කර ඇති දිනයට පෙර කොටපොල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව.

2009 දෙසැම්බර් මස 10 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

### උපලේඛනය

### *I කොටස - වාහන හා සතුන් පිළිබඳ බද්ද - 2010*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148(1) වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත වගුවේ දැක්වෙන ආකාරයේ වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් පනවනු ලැබේ. මෙකී වාර්ෂික බද්ද 2010 ජනවාරි මස 31 වැනි දිනට පෙර කොටපොල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය.

| | | | *රු. ශ.* |
|---|---|---|---|
| (1) | (i) | මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| | (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා - | |
| | | (අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | | (ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| | (iii) | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| | (iv) | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| | (v) | සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| | (vi) | සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| | (vii) | සෑම ඇතකු සඳහා | 50 0 |

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

(3) ඉහත සඳහන් වන "වෙළඳ කාර්ය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

### *II කොටස - ව්‍යාපාර හෝ කර්මාන්ත බලපත්‍ර ගාස්තු*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු, 1988 අගෝස්තු මස 23 වැනි දිනැති IV(ආ) කොටස - පළාත් පාලනය - අංක 520/7 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ හා 2009 ක් වූ ඔක්තෝබර් මස 30 වැනි දින පවත්වන ලද කොටපොල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ ප්‍රාදේශීය සභාවේ අංක 2 : 2 දරන තීරණය අනුව කොටපොල ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ පහත වගුවේ 02 වැනි තීරුවේ දැක්වෙන ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් වෙනුවෙන් ලබාගත යුතු යම් බලපත්‍රයක් සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව එම ව්‍යාපාරය හෝ කර්මාන්තය පවත්වාගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව, එකී වගුවේ අදාළ කර්මාන්තය හෝ ව්‍යාපාරය ඉදිරියේ 3, 4 හෝ 5 යන තීරුවලින් දැක්වෙන අදාළ වන වටිනාකම විය යුතුය. මෙකී ව්‍යාපාර සඳහා වන බලපත්‍රය 2010 ජනවාරි මස 01 වැනි දිනට පෙර ලබාගත යුතුය. ඉහත කී සම්මත අතුරු ව්‍යවස්ථාවල 21 වන කොටසේ දැක්වෙන අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනය සඳහා ඇතුළත් කොට ඇති මෙකී අප්‍රසන්න, අන්තරාදායක සහ අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම්වල ස්වභාවය පහත වගුවේ අනු අංක 27 සිට 42 දක්වා පෙන්නුම් කර ඇත.

| | *ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන විට* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොයික්මවන විට* | *රු. 1,500 ඉක්මවන විට* |
| | | *රු. ශ* | *රු. ශ.* | *රු. ශ.* |
| 01. | නවාතැන් ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 3,000 0 |
| 02. | භෝජනාගාරයක් හෝ භෝජන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 13000 0 |
| 03. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 04. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 200 0 | 500 0 | 1,000 0 |
| 05. | ශීත කරන ලද ආහාර ද්‍රව්‍ය විකිණීම සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 750 0 | 1,000 0 |
| 06. | සිල්ලර කඩයක් පවත්වාගෙන යාම | 250 0 | 600 0 | 1,000 0 |
| 07. | සංචාරක වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | පෞද්ගලික වෙළඳපොලවල් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | රසකැවිලි නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 750 0 | 1,000 0 |
| 10. | අයිස්ක්‍රීම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | හකුරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 200 0 | 750 0 | 1,000 0 |
| 15. | සිසිල්බීම නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1.000 0 |
| 16. | යෝගට් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | කොණ්ඩා සැකසීමේ ස්ථානයක් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 1,000 0 |
| 19. | ආගන්තුක නිවාසයක් (ගෙස්ට් හවුස්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | කිරිහලක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 3,000 0 |
| 21. | කෑම සඳහා පිළියෙල කළ ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ශීතකළ මස් මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | බේකරි කෑම ජංගම රථ මගින් වෙළඳාම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | එළවලු/පළතුරු විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 27. | ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇති - හෝටලයක, ආපන ශාලාවක හෝ නවාතැන් පලක බලපත්‍ර ගාස්තුව, පෙර අවුරුද්දේ හෝටලයේ , ආපන ශාලාවේ, නවාතැන්පලේ ආදායමින් 1% කි.

*අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර යටතට -*

| | | | | |
|---|---|---|---|---|
| 28. | ගවගාලක් පවත්වාගෙන යාම | 250 0 | 750 0 | 1,000 0 |
| 29. | කබොක්, බොරළු හෝ කළුගල් හෑරීම සඳහා ස්ථානයක් (ගල් වලක්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | කම්හලක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 1,000 0 |
| 31. | කළුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | යන්ත්‍රානුසාරයෙන් කළුගල් කැඩීම (ක්‍රෂර්) ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | කුකුළු කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | අම්ලකර වායුව භාවිතාකර (ඔක්සිජන්) යකඩ කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීමේ හෝ ගබඩාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 1,000 0 |
| 36. | පරණ ලෝහ ගබඩාකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 1,000 0 |
| 37. | ඇසිඩ් වර්ග නිපදවීමේ හෝ ගඩබා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ඝෝගාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | විසිරි පින්තාරු (ස්ප්‍රේ පේන්ටින්) ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | ගිනිකෙළි භාණ්ඩ, රතිඤ්ඤා විකිණීම හෝ ගබඩාකර තැබීම සඳහා ස්ථානයක් භාවිතා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | අවමංගල සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම (මල් ශාලාවක්) | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | වාහන සේවා (සර්විස්) කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | පෑස්සුම් (වෙල්ඩින්) ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ගෑස් ගබඩාකර තැබීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |

### *III කොටස - ඇතැම් ව්‍යාපාර හෝ කර්මාන්ත පිළිබඳ බදු*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත වගුවේ 02 වැනි කොටසේ දැක්වෙන යම් ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් මත වාර්ෂික බද්දක් පනවනු ලැබ ඇත. ඒ අනුව ගෙවිය යුතු වාර්ෂික බද්දේ ප්‍රමාණය, එම ව්‍යාපාරය හෝ කර්මාන්තය පවත්වාගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව, එකී වගුවේ අදාළ ව්‍යාපාරය හෝ කර්මාන්තය ඉදිරියේ 3, 4 හෝ 5 යන තීරුවලින් දැක්වෙන අදාළ වන වටිනාකම විය යුතුය. මෙකී වාර්ෂික බද්ද 2010 ජනවාරි මස 31 වැනි දිනට පෙර කොටපොල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය.

| | *ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන විට* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොයික්මවන විට* | *රු. 1,500 ඉක්මවන විට* |
| | | *රු. ශ* | *රු. ශ.* | *රු. ශ.* |
| 01. | විදුලි බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | ඩිජිටල් තාක්ෂණය යොදාගනිමින් මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | අත්යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 300 0 | 750 0 | 1,000 0 |
| 04. | මිරිස්, කෝපි හෝ ධාන්‍ය හෝ කුළු බඩු ඇඹරීම සඳහා ඇඹරුම් හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම (බලවේග) | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | අශ්වබල 10ට අඩු වීමෝලක් හෝ ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | අශ්වබල 10ට වැඩි වීමෝලක් හෝ ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | උළු ගඩොල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | බ්ලොග් ගල් නිෂ්පාදනය කරන ස්ථානයක් (යාන්ත්‍රික) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 12. | ටයර්, ටියුබ් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (යාන්ත්‍රික) | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | යාන්ත්‍රික නොවන ටයර්, ටියුබ් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 1,000 0 |
| 14. | විද්‍යුත් ලෝහාලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | රන්රිදී ලෝහාලේපනය කිරීමේ ස්ථානයක් හෝ ඇළුමිනියම්/පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1.000 0 |
| 16. | බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 750 0 | 1,000 0 |
| 17. | යතුරුපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් | | | |
| 18. | ත්‍රිරෝද රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ (ගරාජයක්) ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ලියවන පට්ටලයක් භාවිතා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | පාවහන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 1,000 0 |
| 24. | ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදනය කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | සුරුට්ටු හෝ බීඩි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | ඉදල්, කොහු, පාපිසි හෝ කොහු ආශ්‍රිත නිෂ්පාදනයක් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | බීරලු වැඩපොලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | කුෂන් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ශීතකරණ, අධිශීතකරණ හෝ වායු සමීකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | ඔරලෝසු අළුත්වැඩියාව/විකිණීම | 300 0 | 500 0 | 750 0 |

### *IV කොටස - ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් වන බදු*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත වගුවේ 01 වැනි කොටසේ දැක්වෙන යම් ව්‍යාපාරයක් මත වාර්ෂික බද්දක් පනවනු ලැබ ඇත. ඒ අනුව ගෙවිය යුතු වාර්ෂික බද්දේ ප්‍රමාණය, එකී වගුවේ 02 වැනි කොටසේ 1 වැනි තිරුවේ දැක්වෙන්නා වූ එම බද්ද ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂය සඳහා වූ එකී ව්‍යාපාරයේ ආදායම අනුව, එකී වගුවේ අදාළ වාර්ෂික ආදායම ඉදිරියේ 2 වැනි තීරුවේ දැක්වෙන වටිනාකම විය යුතුය. මෙකී වාර්ෂික බද්ද 2010 ජුනි මස 30 වැනි දිනට පෙර කොටපොල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය.

1 *වැනි කොටස - ව්‍යාපාරයේ ස්වභාවය :*

01. භාණ්ඩ තොග වශයෙන් රැස්කර තබන ගබඩාවක් පවත්වාගෙන යාම
02. තොග වශයෙන් භාණ්ඩ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
03. රෙදිපිළි හෝ නිමි ඇඳුම් අලෙවිසැලක් පවත්වාගෙන යාම
04. පාවහන් අලෙවිසැලක් පවත්වාගෙන යාම
05. සාප්පු බඩු වෙළඳාම් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

06. විදුලි උපකරණ අලෙවිකිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
07. ප්‍රසිද්ධ සමාගමක භාණ්ඩ බෙදාහැරීමේ නියෝජිතයකු වශයෙන් කටයුතු කිරීම
08. ප්‍රසිද්ධ සමාගමක භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම හා විකිණීම සඳහා ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම
09. මෝටර් වාහන අලෙවි කිරීමේ ස්ථානයක්
10. යතුරුපැදි අලෙවි කිරීමේ ආයතනයක්
11. පාපැදි අලෙවි කිරීමේ ආයතනයක්
12. වාහන අමතර කොටස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
13. යතුරුපැදි/ත්‍රිරෝද රථ අමතර කොටස් අලෙවි කිරීමේ ආයතනයක්
14. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
15. රටබීම (අරක්කු) තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16. අරක්කු/බියර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
17. සිනමාශාලාවක් පවත්වාගෙන යාම
18. මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම
19. භාණ්ඩ ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම
20. රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම
21. සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
22. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
23. වර්ණ රසායනාගාරයක් පවත්වාගෙන යාම
24. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
25. අපනයනය සඳහා තේ සැකසුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
26. අමු තේ දළු එකතු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
27. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
28. තීන්ත අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
29. යකඩ බඩු (හාඩ්වෙයාර්) විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
30. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
31. පෙර පාසල්/දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
